


# දහඅට වසරක අරගල ජීවිතය නිමා කොට හමුදාවට බාර වුණෙමි

## සන්නසට සකස් කරන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න

මම මගේ සෘජු බාරකරු වූ නඩේසන් සමඟ සම්බන්ධතාව ගොඩනඟා ගැනීමට උත්සාහ කළත්, කිසිම පිළිතුරක් ලැබුණේ නැත. එයට පසුව වගකීම් භාර අයගේ ප්‍රතිචාරයක් වෙනුවෙන් කල් ගතකරමින් සිටින විට මා භාරයේ සිටින සාමාජිකයන්ව රඳවාගෙන සිටීම අනතුරුදායක බව මම තේරුම් ගත්තෙමි. තුවාල වූ සමහර සටන්කාමීන්ද, විවාහක සටන්කාමීන් සමඟ තවත් කිහිප දෙනෙක්ම මා සමඟ උන්හ. ඔවුන් සියලු දෙනාටම සාමාන්‍ය ජනයාගේ ඇඳුම් ඇඳගෙන ජනතාව සමඟ පිටව යන මෙන් දැනුම් දුන්නෙමි. සටන්කාමීහු බොහෝ දෙනෙක් හඬ නඟා අඬා වැළපුණහ. එකම පවුලක සාමාජිකයන් එකිනෙකාගෙන් වෙන්ව ඊළඟ මොහොතේ සිදුවන්නේ කුමක්දැයි නොදන්නා ශූන්‍ය අවකාශයකට ඇතුළු වෙන මොහොතක මානසික තත්ත්වයක ඔවුන් සිටින්නට ඇත. තුවාල වූ සටන්කාමීන්ට ඔවුන්ගේ පවුල්වල අයගේ සහ දන්නා කියන අයගේ සම්බන්ධතාවන් ඇති කර දීමට මම උත්සාහ කළෙමි. කාලය ගත වෙත්ම බොහෝ දෙනෙක් පිටව ගොස් අවසන් විය.

පූර්ණී සහ තවත් සහෝදරියන් කිහිප දෙනෙක් කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව තේරුම් ගත නොහැකි වාතාවරණයකට මැදිව උන්හ. පූර්ණීට ගමන් කිරීමට නොහැකි මට්ටමට ඇයගේ කකුලක දරුණු තුවාලයක් විය. චුල්ලිපුරම්හි උපන් ඇය ජ්‍යෙෂ්ඨ දේශපාලන නායකයෙකු වූ අමිර්තලිංගම්ගේ කිට්ටු ඥාතිවරියකි. අමිර්තලිංගම් මෙන්ම පූර්ණී ද වඩාත් දක්ෂ කථිකත්වයකින් යුක්ත වූවාය. පූර්ණීගේ මව්පියෝ මියගොසින්ය. සහෝදරයන් රට හැර දමා ගොසින් ය.

''අපි ජීවත්වෙන්න දන්නේ නැතිව නෙවෙයි සංවිධානයට එක්වුණේ. මිනිසුන් වෙනුවෙන් අරගල කරන්ඩ ඕනෑ කියලයි සංවිධානයට බැඳුණේ. අපිත් අනෙක් අය වගේ ජීවත් වුණා නම් කොයි තරම් හොඳට ජීවත්වෙන්ඩ තිබුණාද? මොනව කරන්ඩද? අපි වගේ කී දෙනෙක් නැති වුණාද? සංවිධානය විශ්වාස කරලා අතපයත් දීලා අද කරන්ඩ දෙයක් හිතාගන්ඩ බැරි තත්ත්වයට වැටිලා ඉන්නවා.'' යැයි ඉතාමත් හිත් වේදනාවෙන් පැවසුවාය. සංවිධානයෙහි සෙන්පතිවරුන් අතරින් ඇමතුමක් ලබාගැනීමට හැකි වූයේ සුසෙ සමඟ පමණි. සුසෙ හමුවීමට යාමට පූර්ණී සූදානම් වූවාය.

දහහතර වන දින සවස් යාමය මුල්ලවායික්කාල් මාවතේ මුලතිව් කරා යාමට සූදානම්ව ජනයා පිරී උන්නෝය. සංවිධානයේ ඉහළ මට්ටම තුළ සිදුවන්නේ කුමක්ද යැයි නොදන්නා තත්ත්වයක් තුළ සටන්කාමීන්ව සංවිධානයේ ඉහළ මට්ටම විසින් සම්පූර්ණයෙන්ම අතහැර දමනු ලැබූ පිරිසක් බවට පත්ව උන්හ. මියගිය අයගේ සිරුරු තැනින් තැන විසිරී තිබුණි. තුවාල ලබා සිටි අයට පවා ප්‍රතිකාර කළ නොහැකි තත්ත්වයක් පැවැතුණි.

ජීවත්වන සටන්කාමියෙකුට කළ හැකිව තිබුණේ එක්කෝ ජනතාව සමඟ එක්ව පිටව යාමය. නැතහොත් සියදිවි නසා ගැනීමය. එයින් බැහැර විකල්පයක් වූයේ නැත. මෙම තත්ත්වය මත දහස් ගණන් සටන්කාමීන් ද ජනතාව සමඟ පිටව යාමට සූදානම්ව උන්හ. අනතුරුදායක තත්ත්වයකදී කිකිළියක් තම පිහාටුවල රැකවරණය තුළට පැටවුන් ළංකර ගන්නා සේ දෙමළ ජනතාව තමන් සමඟ සටන්කාමීන්ව එකතු කරගත්තේ ඇල්මකින් යුතුවය. තුවාල ලබා අසරණව සිටි සමහර සටන්කාමීන්වද ජනතාවගෙන් සමහරු ඔසවාගෙන පිටව යාමට සූදානම් වූහ. බොහෝ සටන්කාමීන්ගේ පිටව යාමේ කැමැත්තක් තිබුණත් ඊළඟට සිදුවිය හැක්කේ කුමක්ද යන සිතේ භීතිය හේතුවෙන් පසුබෑමට ලක්ව උන්හ. ගංවතුර ඉවුරු කඩාගෙන යාමට දඟලන්නා සේ ජනයා මුල්ලිවායික්කාල් පාරේ පොදිකමින් උන්නෝය.

ජනයාට පිටව යාමට නොදී සවස් කාලය වන තෙක් රඳවා තබාගන්නා මෙන් සෙන්පති සුසෙ පවසා ඇති බවත්, ඒ සඳහා සටන්කාමීන් දෙතුන් දෙනෙකු පාරේ නතර කර ඇති බවත් සටන්කාමීහු පැවසූහ. මධ්‍යාහ්නයට පසුව පාරේ රඳවා සිටි සටන්කාමීන් දෙතුන් දෙනාවත් තල්ලුකර වට්ටවා ජනතා රැල්ල පිටව යන්නට වූයේ ය. කවුරුන් පිළිගත්තත් නැතත් විමුක්ති කොටින්ගේ ආයුධ සන්නද්ධ අරගලය ඉතාමත් බියකරු ලෙසින් පරාජයට පත්වූ බවට වන සත්‍ය මම ඒ මොහොතේ තේරුම් ගත්තෙමි.

මුල්ලවායික්කාල්වල ජන තදබදය අඩුවන්නට විය. හමුදාවේ තුවක්කු උණ්ඩ අපේ හිස්වලට ඉහළින් පියාඹා යන්නට විය. තව පැය කීපයක් තුළ සියල්ලම අවසන් වනු ඇත. දැන් මම මා පිළිබඳව තීරණයක් ගත යුතු අවස්ථාවට මුහුණ දී ඇති බව තේරුම් ගත්තෙමි. සයනයිඩ් කුප්පිය කඩා දිවට හලාගන්නවාද? මටම වෙඩි තියා ගන්නවාද? මම හැඟීම් සහ බුද්ධිය අතර අරගලය තුළ පැටළී සිරවී උන්නෙමි. එකම පවුලක් තුළ ජීවත් වූ විමුක්ති අරගල ජීවිතයත්, ජීවය උරාගත් සහෝදර සටන්කාමීන්ගේ මරණත් සහ අරමුණක් වෙනුවෙන් මියයාමට සූදානම්ව තිබූ චිත්ත ධෛර්යත් මගේ හදවතේ ඊයම් බරු මෙන් කිඳා බැස්සේය.

සතුරු පාර්ශ්වය වූ ලංකාවේ හමුදාව වෙත ගොස් බාරවීම යන්න සිත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ශේප කළේය. මම මගේ ජීවිතය නසා ගැනීම ප්‍රයෝජනයක් නොමැති මරණයක් යැයි තේරුම් ගියත් හැඟීම්බරව ජීවිතය අහිමි කර ගැනීම විමුක්ති කොටියෙකුගේ ලක්ෂණය යැයි තේරුම් ගෙන උන්නෙමි. අධිෂ්ඨානය සහ වීරත්වය පිරි සටන්කාමියෙකු බව ඔප්පු කිරීමට මිය යනවාද? ජීවිතය බේරාගන්නා බිය ගුල්ලෙකු ලෙස පැන දුවනවාද? පපුව පුපුරා යනු ඇතැයි සිතෙන අන්දමින් හිරවී කඳුළු පමණක් ගලමින් දෝර ගලන්නට විය.

ඒ අතර මගේ අභ්‍යන්තරික හැඟීම් සියදිවි නසා ගැනීමෙන් මරණයට පත්වීම යන්න පිළිගැනීමට පැකිළෙන බවක් දැනෙන්නට විය. එම මොහොතේදි සිය දිවි නසා ගැනීම යනු කිසිම ප්‍රයෝජයක් රහිත දෙයක් ය යන්න මගේ සිතට දැනුණි. කුමක්දැයි අපැහැදිලි, කුමක්දැයි නොදන්නා ප්‍රතිපල කරා ගමන් කිරීම කොයිකරම් දුරකට සටන්කාමී ස්ත්‍රියකට ආරක්ෂා සහිතද යන්න පිළිබඳව සිතන්නට වූවෙමි. දැනට පවතින අඳුරු සහගත තත්ත්වයට මුහුණ දීමට ධෛර්යක් නොමැතිව සිය දිවි නසා ගන්නවාට වඩා ජීවත්ව සිටිමින් නියමිත වාතාවරණය පසුකර යෑමට අධික මානසික ශක්තියක් අවශ්‍ය ය යන්න බුද්ධිය විසින් මට දන්වන ලදි.

මගේ පුද්ගලික ස්වාභාවය වූයේ බුද්ධිය සහ හැඟීම් එකට එක්ව පවතින ලෙසින් සමබරව තීරණ ගත යුතුය යන්නයි. පුද්ගලික හැඟීම්වලින් කෙරෙන උසිගැන්වීම් නිසා පමණක් මා සටන්කාමියෙකු ලෙස සංවිධානයට එකතු වූයේ නැත. උසස් පෙළ පන්තියේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යාවක ලෙසින් එම වාතාවරණය තුළ මට තිබූ බුද්ධියට අනුව මම සමාජයට සේවය කිරීමේ ආකල්පයෙන් සංවිධානයට බැඳුනෙමි. එවක පැවැති වාස්තවික තත්ත්වය මත ආයුධ අතට ගෙන සටන් කිරීම අපේ ජනතාව වෙනුවෙන් කළ හැකි උසස්ම සමාජ සේවය යැයි මම අදහස් කළෙමි.

සෑම සටන්කාමියෙකුගේම මරණයට පිටුපසින් නිර්මාණාත්මක සාධනීය ප්‍රතිලාභයක් අපේ සමාජයට ලැබෙනු ඇතැයි මම මුළු හදවතින්ම විශ්වාස කළෙමි. එවන් පොදු යහපත උදෙසා ජීවිතය කැප කිරීම යනු මම මුළුමනින්ම එකඟ වූ කරුණක් විය. එම කාල වකවානුවේදී වෙනතක් කිසිම තෝරා ගැනීමකට තැනක් නොමැති වන අයුරින් විමුක්ති කොටි සංවිධානය දෙමළ ජනයාගේ ජනාදරයට ලක්ව බලවත් විමුක්ති සංවිධානයක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පැවැති හෙයින් මම ද විමුක්ති කොටි සාමාජිකාවක ලෙස එයට එක්වුණෙමි.

ජනයාගේ විමුක්තිය උදෙසා අරගල කිරීමේ සිහිනයෙන් සංවිධානයට බැඳුණු මට නොසිතූ අයුරින් ජනතාව අතරෙහි දේශපාලන කටයුතු කිරීමේ වගකීම පැවරුවේය. මම ජනතාව කෙරෙහි මහත් ආදරයක් දැක්වූ හෙයින් කැමැත්තෙන්ම දුෂ්කර කටයුතුවල යෙදුණෙමි. සියලුම ජනයා සැනසිල්ලේ සහ සමානාත්මතාවයෙන් යුතුව ජීවත් වෙන සමාජයක් පිළිබඳව සිතීම පවා මහත් සතුටක් විය. විමුක්ති කොටි සංවිධානය ජයග්‍රහණය කර එවැනි රටක් නිර්මාණය වනු ඇතැයි මම දැඩිව විශ්වාස කළෙමි. ඒ වෙනුවෙන් මම මගේ හදවත, ශරීරය, ජීවය, ආත්මය යන සියල්ලම කැප කර සටන් කිරීමට අදිටන් කළෙමි.

ඊට පසු කාලයන්හි මට ලැබුණු අත්දැකීම්, පාඩම් අරගලය කෙරෙහි අවිශ්වාසය ඇති කළ තත්ත්වයන්, අවිශ්වාසය ඇති කළ තීරණ, ජනතාවගේ යහපත පෙරටු කර නොගෙන දියත් කළ ක්‍රියාකාරකම් ආදිය මා තුළ දැඩි හැඟීම් කැකෑරීමක් සහ ස්වයං විවේචනයක් ඇති කළේය. එහෙත් දහස් ගණනකගේ ජීවිත පරිත්‍යාග අපතේ යා නොදී වර්ධනය වෙමින් පැවැති යහපත් දේශපාලන වාතාවරණය නායකතුමා ප්‍රයෝජනයට ගෙන ජනතාව ස්ථිරසාර සාමයක් ඇති කර දෙනු ඇතැයි සටන්කාමීන් මෙන් මමද දැඩි ලෙස විශ්වාස කළෙමි.

නායකත්වය විසින් අවසන් යුද්ධය සඳහා තීරණ ගන්නා ලද අවස්ථාවේ මගේ කුඩා බුද්ධිය අනුව එය යහපත් තීරණයක් ලෙසින් මට දැනුණේ නැත. ඊට පසු කාල වකවානුව තුළ ඇතිවූ ජයග්‍රහණය කළ නොහැකි යුද්ධයක් සඳහා සටන්කාමීන්ගේ හැඟීම් ද, ප්‍රාණය ද භාවිතා කරන ආකාරයත්, ජනතාවගේ විශ්වාසය, මුලාවක් බවට පත් කළ ක්‍රියාකාරකම් ද මා තුළ පමණක් නොව බොහෝ සටන්කාමීන්, වගකීම්භාර තනතුරු දැරූවන් මෙන්ම සෙන්පතිවරු පවා එකඟ වූ ඒවා නොවීය.

එහෙත් නායකත්වයේ අණට අවනතව ක්‍රියා කිරීම අපගේ ප්‍රතිපත්තිමය බැඳීමටත්, සංවිධානය කෙරෙහි වන විශ්වාසයටත් වන අනන්‍යතා ලක්ෂණ විය. අපි වැඩුණේ එවැනි මිලිටරිමය සංස්කෘතියක් යටතේ ය. පුදුකුඩුයිරුප්පු හි දි පැවැත් වූ අවසන් හමුවේ දී පොට්ටුඅම්මාන් පැවසූ සේ නායකතුමා විසින් ප්‍රාතිහාර්යයක් පානු ඇතැයි යන විශ්වාසයෙන් ඔහුගේ අණට අවනතව කටයුතු කිරීම හැර අපට විකල්පයක් නොවීය.

මැයි මාසයේ දාසය වන දින සවස මම එහි සිටි සටන්කාමීන් සමඟ එක්ව පිටව යාමට තීරණය කළෙමි. වචනවලින් විස්තර කළ නොහැකි ලෙසින් ලේ, මස් සහිත හදවත කීතු කරවන වේදනාවකින් යුතුව මුල්ලිවයිකාල්වල සිට පිටතට පැමිණි එම වාතාවරණය පහසුවෙන් තේරුම් කර දිය නොහැකිය. මා සමඟ උන් සටන්කාමී සහෝදරියන් දුන් පරණ සල්වාර් ඇඳුම ඇඳගෙන ජනතාව සමඟ එක්ව අපි ගමන් කළ බවක් මගේ මතකයේ නැත. මහත් ජන රළ විසින් අපව ද ඇදගෙන යනු ලැබුවා සේ මට දැනුණි.

1991.07.29 වෙනි දින විමුක්ති කොටි සංවිධානටය බැඳී 2009 වසරේ මැයි මස 16 වන දින තෙක් 18 වසරක් වූ අරගල ජීවිතය එයින් අවසන් විය. ඊළඟට සිදුවන්නේ කුමක්ද යන්න සිතා ගැනීම පවා බියකරු විය. අපට පිටුපසින් තවත් වෙඩි පුපුරණ හඬ සහ කම්පනයන් ඇසේ. කාල වර්ණ දුම් කඳු අහස උසට නැඟෙමින් තිබිණ. සටන් බිමේ දී එකට ජීවිතය බෙදාගත් ඥාතීන්ගේ ප්‍රාණ වේදනාව පිරුණු වේදනාත්මක ඇස්වල අවසන් හුස්ම බෙංගාල මුහුදේ විශාල රළ සේ මගේ හදවත තුළ නැඟෙන්නට විය. ප්‍රාණය නිරුද්ධ සිරුරක් සේ මාව දරාගැනීම මට මහත් බරක් විය. මහජනයාගෙන් පිරී ඉතිරී ගොස් තිබුණ මුලිතිව් පිට්ටනියේ විදුලි බුබුළු දහවල මෙන් ආලෝකය සපයමින් තිබුණි. හමුදාව පිට්ටනිය වටා රැකවලේ උන්නේය. සිත තුළ ගැඹුරු අඳුරු අගාධයක් ලෙසින් දර්ශනය වූ ඊළඟ අදියරට මමත් ප්‍රවේශ වූවෙමි.